1st Place Winner
National Productivity
Award 2020

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
## CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | CSS/03/01/i/පොදු | ඔබේ අංකය<br>உனது இல<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2023.06 30 |

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්/සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්
දකුණු පළාත

**මහජන දිනයේදී රාජ්‍ය නිලධාරීන් රාජකාරි ස්ථාන වල රැදී සිටීම**

උක්ත මැයෙන් යුතු මාගේ සමාංක හා 2022.04.07 දිනැති උපදෙස් ලිපිය හා බැඳේ. (ඇමුණුම 01)

02. ඊට අමතරව සඳුදා දින “මහජන දිනය” ලෙස ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධව නිකුත් කරන ලද ජනාධිපති ලේකම්ගේ අංක : PS/GPA/Circular/29/2020 හා 2020.09.15 දිනැති ලිපියේ ( ඇමුණුම 02) සහ රජයේ නිලධරයන්ගේ වගකීම් සහ සේවාලාභීන්ගේ අයිතිවාසිකම් මැයෙන් වූ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද අංක EST-1/MISCL/06/0032 හා 2015.05.20 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 11/2015 හි 02 ඡේදයේ අංක 1 මහජන දිනය ලෙස සඳහන් ඡේදය කෙරෙහිද ඔබගේ අවධානය යොමු කරවමි.

03. ඉහත චක්‍රලේඛ හා උපදෙස් ලිපි මගින් රජයේ ආයතන වෙත පැමිණෙන පොදු මහජනතාවට, අදාළ නිලධාරීන් මුණගැසීමට සහ ස්වකීය අවශ්‍යතා ඉටුකර ගැනීමට හැකිවනු පිණිස මහජන දිනය වන සඳුදා දින සියලුම ආයතනවල සේවය කරනු ලබන නිලධාරීන් තම කාර්යාලයේ රැදී සිටින බවට සියලුම ආයතන ප්‍රධානීන් විසින් වග බලා ගත යුතු බවත්, මහජන දිනයට වෙනත් රැස්වීම්, වැඩමුළු, උත්සව ආදිය සංවිධානය නොකළ යුතු බවත්, ඒවා වෙනුවෙන් සහභාගී වීම සඳහා කාර්යාලයෙන් බැහැරව නොයා යුතු බවත් දැනුම් දී ඇත.

04. ඒ අනුව එම චක්‍රලේඛ හා උපදෙස් ලිපි අනුව කටයුතු කරන ලෙසත්, මේ සම්බන්ධව ඔබට අයත් ආයතනවල ආයතන ප්‍රධානීන් ද දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත් කාරුණිකව දන්වමි.

සුමිත් අලහකෝන්
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 4944002
කාර්යාලය / காரியாலயம் / Office 091 4119011, 091 2234052
ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.
“සෞභාග්‍යමත් දකුණු පළාතක්”

ඇමුණුම් - 01 (28)

CSS/03/01/i/පොදු 2022.04 ෆ

සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්/සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

<u>මහජන දිනයේදී රාජ්‍ය නිලධාරීන් රාජකාරි ස්ථාන වල රැඳී සිටීම</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරතුමා විසින් මා වෙත එවන ලද අංක GVO/DM/22/03/29/06 හා 2022.03.29 දිනැති ලිපිය සම්බන්ධවයි.

02 මහජන දිනය වන සඳුදා දින රාජ්‍ය නිලධාරීන් කාර්යාල තුළ රැඳී නොසිටීම සම්බන්ධවත්, එබැවින් විවිධ රාජකාරි ඉටු කර ගැනීම සඳහා පැමිණෙන පොදු මහජනතාව මුහුණ දෙන අපහසුතාවයන් පිළිබඳවත් එමගින් දැනුම් දී ඇත.

03. පොදු මහජනතාව ස්වකීය අවශ්‍යතා ඉටුකර ගැනීමට මහජන දිනය වන සඳුදා දිනය තුළ කාර්යාල වෙත පැමිණෙන බැවින්, එදිනට වෙනත් රැස්වීම් යොදා නොගන්නා ලෙසත්, නිලධාරීන් තම කාර්යාලයේ රැඳී සිටින බවට සියලුම ආයතන ප්‍රධානීන් වගබලා ගත යුතු බවටත් කාරුණිකව අවධාරණය කරමි. එමෙන්ම සඳුදා දින මහජන දිනය ලෙස ප්‍රකාශයට පත් කරමින් ජනාධිපති ලේකම් විසින් 2020.09.15 දිනැතිව අංක PS/GPA/Circuler/29/2020 දරන චක්‍රලේඛය නිකුත් කර ඇති බව සිහිපත් කරමි.(ඇමුණුම)

04 මේ සම්බන්ධයෙන් ඔබට අයත් ආයතනවල ආයතන ප්‍රධානීන් ද දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

ආර්. සී. ද සොයිසා,
ප්‍රධාන ලේකම්
දකුණු පළාත.

o/c

පිටපත :- ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය, දකුණු පළාත - කරු. දැ.ගැ.ස

ආමුන්තිම 02

# ජනාධිපති කාර්යාලය
# சனாதிபதி அலுவலகம்
# PRESIDENTIAL SECRETARIAT

චක්‍රලේඛ අංක : PS/GPA/Circular/29/2020
2020.09.15

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
දිසාපති/ දිස්ත්‍රික් ලේකම්වරුන්,
ආණ්ඩුකාර ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරුන් වෙත

**සඳුදා දින "මහජන දිනය" ලෙස ප්‍රකාශයට පත්කිරීම**

සෑම සතියකම සඳුදා දිනය සියලුම රාජ්‍ය ආයතන වල "මහජන දිනය" ලෙස නම් කිරීමට 2020 සැප්තැම්බර් මස 09 වන දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇති බැවින් වහාම ක්‍රියාත්මක වන පරිදි සෑම සතියකම සඳුදා දිනය සියලුම රාජ්‍ය ආයතන වල මහජන දිනය ලෙස ක්‍රියාත්මක කිරීමට ඔබ යටතේ පවතින සියලුම ආයතන දැනුවත් කර මහජන සේවාවන් ඉටුකිරීමට යොමුකරවන ලෙස දන්වමි.

02. රජයේ ආයතන වෙත පැමිණෙන පොදු මහජනතාවට, අදාළ නිලධාරීන් මුණගැසීමට සහ ස්වකීය අවශ්‍යතා ඉටුකර ගැනීමට හැකිවනු පිණිස, සියලුම ආයතනවල සේවය කරනු ලබන නිලධාරීන් මහජන දිනය වන සඳුදා දිනය තුළ තම කාර්යාලයේ රැඳී සිටින බවට සියලුම ආයතන ප්‍රධානීන් විසින් වගබලා ගතයුතු බව ද දැනුම් දෙමි.

03. එමෙන්ම, මහජන දිනයේ දී අත්‍යාවශ්‍ය කටයුත්තක් දී හැර සියලුම නිලධාරීන් නිවාඩු ගැනීමෙන් මෙන්ම කාර්යාලයෙන් පිටත වෙනත් කටයුතු යොදාගැනීමෙන් වැළකී සිටින ලෙස ද දන්වමි.

පී බී ජයසුන්දර
ජනාධිපති ලේකම්

පිටපත්: අග්‍රාමාත්‍ය ලේකම්
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
විගණකාධිපති

ගාලු මුවදොර, කොළඹ 01 | දුරකථන ++ 94 (0) 11 2354418 | ෆැක්ස් | ඊ-තැපෑල